ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1998 අංක 16 දරන පැල්පොල විපස්සී පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 අප්‍රේල් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.75 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

## 1998 අංක 16 දරන පැල්පොල විපස්සී පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 08 වන දින]

එල්. ඩී.–ඕ. 16/96.

**පැල්පොල විපස්සී පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"පැල්පොල විපස්සී පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් විසින් එකඟ වන ලද රීතිවලට අනුකූලව එකී පදනම සම්බන්ධ සියලු කටයුතු සහ පරමාර්ථ ඵලදායි ලෙස කරගෙන යෑම සහ ඉටු කිරීම සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවාගෙන තිබුණ හෙයින් ද ; පූර්විකාව.

එකී පදනම සංස්ථාගත කරන මෙන් එය විසින් ඉල්ලා ඇති හෙයින් සහ එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1998 අංක 16 දරන පැල්පොල විපස්සී පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) පැල්පොල විපස්සී පදනමෙහි සාමාජිකයන් වශයෙන් දැනට සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "පැල්පොල විපස්සී පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එම නමින් සංස්ථාව විසින් ද සංස්ථාවට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පැවරිය හැකි වන්නේ ය. තවද පොදු මුද්‍රාවක් තබාගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. පැල්පොල විපස්සී පදනම සංස්ථාගත කිරීම.

**3.** සංස්ථාව සංස්ථාපනය කරන්නේ යම් පොදු අරමුණු සඳහා ද එම අරමුණු පහත සඳහන් අරමුණු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු අරමුණු.

(අ) බුද්ධ ධර්මය, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ ශිෂ්ටාචාරය ප්‍රචාරයට පත් කිරීම ;

(ආ) ලෝකයේ වෙසෙන සියලු ජනතාවන් අතර ජාත්‍යන්තර සහෝදරත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) වාර්ගික, ආගමික සහ ගෝත්‍රික එකමුතුව ප්‍රවර්ධනය කිරීම සඳහා සහාය වීම;

(ඈ) ආගමික උපදෙස්වල කාර්ය සඳහා පාඨශාලා සහ අධ්‍යාපනික ආයතන සහ විද්‍යාල ආදිය පිහිටුවීම, පවත්වාගෙන යාම, කළමනාකරණය කිරීම හා ශ්‍රී ලංකාවේ සහ පිටරට සිටින ආධාර ලැබීමට සුදුසු ශිෂ්‍යයන්ට ණය, ප්‍රදාන, ශිෂ්‍යත්ව සහ වෙනත් ආධාර ලබා දීම;

(ඉ) අධ්‍යාත්මික, දාර්ශනික, සංස්කෘතික හා ආගමික අධ්‍යාපනයට ධෛර්යය දීම සහ මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් සේවය කිරීමට කැප වූ ජීවිතයක් ගත කිරීම සඳහා ශිෂ්‍යයන් සහ අතිකුත් උනන්දුවක් දක්වන තැනැත්තන් පුහුණු කිරීම;

(ඊ) බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීමෙහි නියුක්තව සිටින තැනැත්තන්ට මූල්‍ය සහ වෙනත් ආධාර සැපයීම;

(උ) වන්දනා විවේකාගාර ළමා උයන්, ක්‍රීඩා භූමි, ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන, අනාථ නිවාස, සායන, ආරෝග්‍ය ශාලා, රෝග නිශ්චය කිරීමේ මධ්‍යස්ථාන සහ ප්‍රජා ශාලා ඉදි කිරීම, පවත්වාගෙන යෑම සහ පරිපාලනය කිරීම සහ නැතිබැරි තැනැත්තන් සඳහා කවර ආකාරයක වුව ද වෛද්‍ය සහන සහ ආධාර සැපයීම;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, සාකච්ඡා, වැඩමුළු, පන්ති, විවාද, සම්මේලන, චාරිකා, විනෝද ගමන් සහ වෙනත් ක්‍රියාකාරකම් පිළියෙල කිරීම, සංවිධානය කිරීම, පැවැත්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(එ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා පුස්තකාල හා වෙනත් සේවා සැපයීම සහ පොත්, වාර සඟරා, සිඟිවටන, ප්‍රකාශන, සඟරා සහ පුවත් පත් මුද්‍රණය කිරීමට, පළ කිරීමට සහ විකිණීමට සහාය වීම;

(ඒ) ශ්‍රී ලංකාවේ හෝ විදේශවල පවත්වනු ලබන ආගමික, දාර්ශනික හා සාම සම්මේලනවලට නියෝජිතයන් යැවීම;

(ඔ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමඟ සහයෝගීව කටයුතු කිරීම සහ ලෝක ජනතාව අතර සාමය සහ එකමුතුකම වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම:

(ඕ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීමට අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය :—

(අ) සංස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය කිරීම:

(ආ) යම් තැනැත්තකුගෙන් හෝ සංස්ථාගත වූ හෝ නොඑසේ වූ පුද්ගල මණ්ඩලයකින්, මුදලින් හෝ ද්‍රව්‍යවලින් වූ යම් ආධාරයක්, ප්‍රදානයක් හෝ ත්‍යාගයක් ලබාගැනීම හෝ එකතු කිරීම:

(ඇ) සංස්ථාවේ පරමාර්ථ කිසිවක් හෝ සියල්ල හෝ වැඩිදුරටත් ඉටු කර ගැනීමේ කාර්යය සඳහා විදේශීය රටවල සංස්ථාවේ ශාඛා සංවිධාන පිහිටුවීම:

(ඈ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම සහ එසේ ණයට ගන්නා ලද හෝ ලබා ගන්නා ලද ඒ මුදල් ගෙවීම සුරක්ෂිත කිරීම සඳහා උකස්කර හෝ බැඳුම්කර ලියා අත්සන් කිරීම: සහ

(ඉ) සංස්ථාවේ පරමාර්ථ සඳහා අවශ්‍ය සියලු ගිවිසුම්වලට හා එකඟවීම් වලට කෙලින් ම හෝ සංස්ථාව විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ එහි නිලධරයන්, සේවකයන් හෝ නියෝජිතයන් මඟින් එළඹීම හෝ එම ගිවිසුම් හෝ එකඟවීම් ඉටු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීම, එහි කාර්යය ඉටු කිරීම සහ කර්තව්‍ය කිරීම, මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීතිවලට අනුකූලව පත් කරනු ලබන හෝ තෝරා පත් කරනු ලබන හෝ භාරකාර සභාපති විසින් කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි කුමක් සඳහන් වුව ද, පදනමේ ආරම්භක සභාපති වූ පූජ්‍ය පැල්පොල විපස්සි හිමි ප්‍රථම භාරකාර සභාපති විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

6. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, පරිත්‍යාගයකින්, මුදල් පිළිබඳ නීයාදනයකින් හෝ අන් ලෙසකින් සංස්ථාව සතු වන කවර වුව ද චංචල හෝ නිශ්චල දේපළක් මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් හැකියාව හා ශක්‍යතාව තිබිය යුතු අතර, එබඳු සියලු දේපළ තත් කාලයෙහි සංස්ථාවේ බලාත්මකව පවතින රීතිවලට යටත්ව ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ලෙසකින් බැහැර කිරීමේ පූර්ණ බලතල සහිතව, මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාව විසින් ඒවා දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

7. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා, නිලධරයන් තෝරා පත් කර ගැනීම සඳහා ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ ඒ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ද සංස්ථාවේ භාරකාර සභාපති ධුරයේ පුරප්පාඩුවක් වුවහොත් එය පිරවීම සඳහා අවශ්‍ය වන්නා වූ, රීති ඇතුළුව මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ, රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. ඒ රීති සෑදීමෙන් පසු එවැනි ම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමෙහි බලපැවැත් වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය. මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ ප්‍රතියෝජනය කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන්, සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

8. මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනම විසින් ගෙවනු ලැබිය යුතුව තිබුණු සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, ඒ දිනය වන විට පදනමට අයවිය යුතුව තුබූ සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

පදනම විසින් ගෙවනු ලැබිය යුතුව සහ පදනමට අය විය යුතුව තිබූ ණය.

9. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ භාරකාර සභාපතිගේ භාරයෙහි තිබිය යුතු අතර, එය ඒ භාරකාර සභාපති සහ සංස්ථාවේ තත්කාලයෙහි බල පවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළයුතු අතර ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.